## ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය – 2014

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 ජනවාරි 01 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ පිරිවැය රු.1,810,669,218 ක වත්කම් තවදුරටත් භාවිතා කරමින් පැවතියද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව සාධාරණ අගයක් පෙන්නුම් කිරීම සඳහා ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල රු.241,628,346 ක් ලැබිය යුතු ආදායම් ලෙස දක්වා තිබුණු අතර අවිනිශ්චිත ලැබීම් සම්බන්ධව මූල්‍ය ප්‍රකාශන වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. එසේම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 10 හි ඡේද අංක 19 ප්‍රකාරව ආදායම හඳුනාගැනීමේදී දක්වා ඇති කරුණු අනුව ලැබිය යුතු ශිෂ්‍ය ආදායම හඳුනාගෙන නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ නිරවුල් කරන ලද 2013 වර්ෂයට අදාල වූ ආරක්ෂක සේවා සඳහා රු.2,392,985 ක් අතීතානුයෝගීව ගැලපීම් කර දක්වනු වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ආ) ගොඩනැගිලි නඩත්තු සඳහා දරන ලද රු.626,793 ක් අයභාර වියදම් ලෙස ගිණුම් ගත කිරීම වෙනුවට ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඇ) වත්කම් නඩත්තු කිරීම වෙනුවෙන් දරන ලද රු.5,353,038 ක් ප්‍රාග්ධන වියදම් යටතේ ගිණුම් ගත කර තිබුණි.

(එ) **2015 ජූලි 06** දිනැති අංක **737** දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව ශිෂ්‍යත්ව ගිවිසුම් කඩ කිරීමෙන් ලද ආදායම ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර ඉන් ලද ආදායමින් ආචාර්යවරුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා වැය කිරීමට ප්‍රතිපාදන ඇතත් සමාලෝචිත වර්ෂයේ දරන ලද රු.**392,727** ක වියදම ගිවිසුම් කඩ කිරීමෙන් ලද මුදලින් අඩුකර දක්වා තිබුණි.

**2.2.3** නොසැසඳු පාලන ගිණුම්

පහත සඳහන් විෂයයන්ගේ මූල්‍ය ප්‍රකාශන, උපලේඛනයේ හා ලෙජර්යේ දැක්වෙන ශේෂයන් අතර නොසැසඳීම් දක්නට ලැබුණි.

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | උපලේඛන / ලෙජර් ශේෂය | වෙනස |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| (අ) | ගිවිසුම් කඩකිරීමෙන් ලද ආදායම | 9,580,982 | 7,642,024 | 1,938,958 |
| (ආ) | ස්ථාවර තැන්පත් පොලී | 37,852,367 | 33,566,505 | 4,285,862 |

**2.2.4** විගණනය සඳහා සාක්ෂි නොවීම

දූරස්ථ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියෙන් විවෘත විශ්වවිද්‍යාලයට ලබාදී ඇති එකතුව රු.**204,167,730** ක ස්ථාවර වත්කම් තහවුරු කර ගැනීම සඳහා ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**2.3** ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගිවිසුම් කඩකළ නිලධාරීන් **25** දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.**59,273,528** ක් **2014** දෙසැම්බර් **31** දින වන විටත් අයකර ගැනීමට ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව **2014** දෙසැම්බර් **31** දිනට ලැබිය යුතු ශේෂය තුළ **2011** ට පෙර සිට ලැබිය යුතුව තිබු රු.**2,033,756** ක් සමාලෝචිත වර්ෂය තුළදීද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) **2014** දෙසැම්බර් **31** දින වනවිට අයනොවී පවතින සේවක ණය ශේෂය රු.**760,408** ක් වූ අතර මෙම ණය ශේෂය තුල වසර **05** කට වඩා පැරණි මියගිය, විශ්‍රාමික, සේවය අත්හිට වූ නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.**522,578** ක් විය.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.**

**විගණනයේදී නිරීක්ෂණය වු නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවු අවස්ථා පහත දැක්වේ.**

| | **නීති රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයට 2014 වර්ෂයේ වැටුප් හා දීමනා ලෙස රු.544,713,923 ක් ගෙවා තිබුණද විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය ප්‍රකාරව පැමිණීම සටහන් කිරීම් ලේඛන විගණනයට ඉදිරිපත් නොවිණි. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය -2006 3.2 වගන්තිය | (i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2013 හා 2014 වර්ෂ වල ආරක්ෂක සේවා සැපයීම පෞද්ගලික සමාගමක් වෙත පවරා තිබුණු අතර ඒ වෙනුවෙන් 2013 සහ 2014 වර්ෂ වෙනුවෙන් පිළිවෙලින් රු.16,397,896 ක් හා රු.6,132,003 ක් ගෙවා තිබුණි.<br><br>(ii) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම් කර්මාන්ත හතරක් සඳහා ශ්‍රමිකයන් ලබාගැනීමට තරඟකාරී මිල කැඳවීම් සිදුනොකර රු.3,390,107 කට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 371 (2) (ආ) වගන්තිය | ලබාදිය යුතු උපරිම තත්කාර්ය අතුරු අග්‍රිම වටිනාකම රු.20,000 ක් වුවද විශ්වවිද්‍යාලය විසින් එම සීමාව ඉක්මවා භාණ්ඩාගාර අනුමැතියකින් තොරව අවස්ථා 158 කදී එකතුව රු.10,029,529 ක මුදලක් අත්තිකාරම් වශයෙන් නිකුත් කර තිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 371 (4) වගන්තිය | අවස්ථා 20 කදී ලබාගත් අත්තිකාරම් රු.341,380 ක් ලබාගත් අරමුණ සඳහා උපයෝජනය කිරීමකින් තොරව විශාල කාල ප්‍රමාදයකින් පසු ආපසු ගෙවා තිබුණු අතර අවස්ථා 03 කදී ලබාගත් |

| | |
|---|---|
| | රු.637,760කින් ඉතිරි මුදල රු.246,742 ක් දින 5 සිට දින 29 දක්වා වූ කාල ප්‍රමාදයකින් පසු පියවා තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 395 (ඇ) වගන්තිය | එක් එක් මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශ ඊළඟ මාසයේ 15 දිනට පෙර පිළියෙල කළයුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.358,891,350 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.145,004,347 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.213,887,003 ක වර්ධනයක් දක්නට ලැබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව ශිෂ්‍ය ගාස්තු ආදායම රු.322,913,073 කින්ද රාජ්‍ය ප්‍රදාන රු.120,283,000 කින්ද වැඩිවීම සහ ක්ෂය වීම් රු.188,716,620 ක අඩුවීම මෙම මූල්‍ය ප්‍රතිඵලයේ වාසිදායක වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4.** මෙහෙයුම් සමාලෝචනය

4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) විශ්වවිද්‍යාලය විසින් බදුල්ල අධ්‍යයන මධ්‍යස්ථානය පවත්වාගෙන යන බදුලු පිටිය ඉඩම විශ්වවිද්‍යාලය වෙත පවරාගැනීම සඳහා එහි තක්සේරු වටිනාකමින් සියයට 25 ක් එනම් රු.100,000 ක මුදලක් 2013 මාර්තු 20 දින ප්‍රාදේශීය ලේකම් බදුල්ල වෙත ගෙවා තිබු නමුත් 2015 මැයි 18 දක්වා ඉඩම පවරා ගෙන නොතිබුණි.

(ආ) විවෘත විශ්වවිද්‍යාලය විසින් මාතර ප්‍රාදේශීය මධ්‍යස්ථානයට අයත් ඉඩම තක්සේරු කරවා ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට යොමුකර ඇතත් විශ්වවිද්‍යාලයේ සහයෝගය නොලැබීම හේතුවෙන් 2015 අප්‍රේල් 30 දින වන තෙක්ද ඉඩම තක්සේරු කර නොතිබුණි.

(ඇ) 2008 වත්කම් ප්‍රත්‍යාගණනයේදී සිදුවී ඇති අඩුපාඩු නිසා ගිණුම්වල දැක්වෙන ප්‍රත්‍යාගණනය කළ වත්කම්වල වටිනාකම නිවැරදි නොවන බව පසුගිය විගණන වාර්තා මඟින් පෙන්වා දී ඇති අතර අදාල දූර්වලතාවයන් නිවැරදි කිරීම සඳහා 2012 වර්ෂයේදී තක්සේරු දෙපාර්තමේන්තුවේ සහාය ලබාගෙන නැවත ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කළද 2015 ජුනි 15 තෙක් අවසන් වාර්තාවක් ලබා ගෙන වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම සිදුකර නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ පරිගණක ගිණුම් පද්ධතිය මඟින් ලෙජර් ගිණුම්වල නිවැරදි තත්ත්වයන් නිරූපනය නොවූ අවස්ථා නිරීක්ෂණය වූ අතර එවැනි අවස්ථාවල හස්ත සටහන් මඟින් නිවැරදි කිරීම් සිදුකර තිබුණි. මෙවැනි තත්ත්වයන් තුළින් දූර්වල ගිණුම්කරණ පද්ධතියක් ඇතිවීමේ හැකියාවක් පවතින බව නිරීක්ෂණය විය.

4.2 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.**

(අ) විවෘත විශ්වවිද්‍යාලය සතු වර්ග අඩි 1,000 ක ගොඩනැගිල්ලක තක්සේරු වටිනාකම මත කුලී තක්සේරු කිරීමකින් තොරව සහ ජලය,විදුලිය,ආරක්ෂක හා පවිත්‍රතා සේවා වියදම් පිළිබඳව නිවැරදි ඇස්තමේන්තු ලේඛන සකස් නොකර රු.15,000 ක මාසික කුලියකට ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයට ලබා දී තිබුණි.

(ආ) ආචාර්යවරුන් විසින් සමාලෝචනය කර ලකුණු ලබාදෙන ලද කාර්ය පැවරුම් අප්‍රමාදව සිසුන් වෙත යොමු කළ යුතු වුවද, කාර්ය පැවරුම් 7,000 කට ආසන්න ප්‍රමාණයක් 2015 පෙබරවාරි 11 වනවිටද තැපෑලට යොමු නොකොට ශාඛාවේ ගොඩගසා තිබුණි. අදාල විභාග පැවැත්වීමට පෙර මෙම කාර්ය පැවරුම් සිසුන්වෙත ලබාදීමේ අවශ්‍යතාවය කෙරෙහි විශ්වවිද්‍යාලය අවධානය යොමුකර නොතිබුණි.

4.3 **නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්**

එකතුව රු.21,741,786 ක් වූ අරමුදල් 35 ක් වසර 01 සිට වසර 07 දක්වා උපයෝජනය කර නොතිබුණි.

4.4 **ආර්ථික නොවූ ගනුදෙනු**

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

2012 හා 2013 වර්ෂවලදී ඕකිඩ් හරිතාගාරයක් හා ප්‍රධාන ගබඩාවක් ඉදිකිරීම සඳහා පිළිවෙලින් රු.149,666 ක් හා රු.242,220 ක් වැය කර තිබුණද සමාලෝචිත වර්ෂය දක්වාම මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

4.5 **විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්**

විශ්වවිද්‍යාලය වෙත නිත්‍යානුකූලව අයිතිය පවරා නොගත් ඉඩම් වල පිරිවැය රු.500,159,570 ක ඉදිකිරීම් සිදුකර තිබුණි.

4.6 **කාර්ය මණ්ඩල පරිපාලනය**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විවෘත විශ්වවිද්‍යාලයේ අනුමත කාර්ය මණ්ඩලය 1,242 ක් වූ අතර පුරප්පාඩු 139 ක් පැවතුණි.

5. **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

5.1 **ක්‍රියාකාරී සැලැස්ම**

ක්‍රියාකාරී සැලැස්මට අනුව 2014 වර්ෂයේ සිදුකිරීමට අපේක්ෂිත කාර්යයන් 10 ක් ඉටුකර නොතිබු අතර කාර්යයන් 06 ක ප්‍රගතිය වාර්තා කොට නොතිබුණි. සැලසුම් කරන ලද කාල පරිච්ඡේදය තුළ කාර්යයන් ඉටුනොකිරීම විශ්වවිද්‍යාලයේ අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.

**5.2 අභ්‍යන්තර විගණනය**

**ක්‍රමානුකූල හා විෂයය ගත ප්‍රවේශයක් භාවිතා කරමින් අවධානම් කළමනාකරණය, යහපාලනය හා පාලන ක්‍රියාවලින් දියුණු කිරීමට සහ ඇගැයීමට අභ්‍යන්තර විගණනය දායක විය යුතු වුවත් කාරක ප්‍රාග්ධන කළමනාකරණය, ආයෝජනය, මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් පිළිපැදීම කෙරෙහි ආයතනයේ ඉහළ කළමනාකාරීත්වයේ අවධානය යොමුකරවීමට අභ්‍යන්තර විගණනය විසින් කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.**

**5.3 අයවැය ලේඛනමය පාලනය**

**අයවැය ගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේදී ප්‍රමාණාත්මක විචලතාවයන් දක්නට ලැබිණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බව නිරීක්ෂණය විය.**

**6. පද්ධති හා පාලනයන්**

**විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත වරින් වර දැනුම් දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.**

**(අ) ස්ථාවර වත්කම් පාලනය**
**(ආ) වාහන පාලනය**
**(ඇ) කොන්ත්‍රාත් පාලනය**
**(ඈ) කාර්ය මණ්ඩල කළමනාකරණය**
**(ඉ) අරමුදල් පාලනය**
**(ඊ) මුදල් හා බැංකු කටයුතු**
**(උ) ගබඩා පාලනය**